# අරුම පුදුම බලය




TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

www.RTIwatch.lk

Sarvodaya

## ඔබ දන්නවාද?

තොරතුරු දැනගැනීමට ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙස ඔබට මූලික අයිතිවාසිකමක් ඇති බව...

ඒ කියන්නේ,

ඔබ ඔබගේ ඡන්ද බලයෙන් තෝරා පත්කරගන්නා නියෝජිතයන් සහ අනෙක් මහජන නිලධාරීන් විසින් කරනු ලබන ක්‍රියා පිළිබඳ දැනගැනීමේ අයිතිය

## තවත් පැහැදිලි කළොත්...

- ඔබට වාතය, ජලය හා ආහාර අවශ්‍ය වන්නා සේ තොරතුරු දැනගැනීමද අත්‍යවශ්‍ය වේ.
- සෑම තොරතුරක්ම නිර්මාණය වන්නේ රාජ්‍ය නිලධාරින් විසින් මහජන මුදල් යොදාගෙන සිදුකරන කාර්යයන්ගෙන්. ඒ නිසා එම තොරතුරු දැනගැනීම ඔබේ අයිතියක්.
- නිලධාරින් තොරතුරු නිර්මාණය කළ යුත්තේ ඔවුන් සේවය සපයන ජනතාවගේ යහපතට, ප්‍රයෝජනයට. එම තොරතුරු වසන් කිරීමට ඔවුන්ට අයිතියක් නෑ.

## තොරතුරු කියන්නේ මොනවාද?

''දැනුම බලයයි''. අපට දැනුම ලබා ගැනීමට පදනම සපයන්නේ 'තොරතුරු' යි. තොරතුරු මිනිසාගේ පැවැත්මට අත්‍යවශ්‍ය මෙවලමක්. ඒ කියන්නේ ඔබගේ එදිනෙදා ජීවිතයේ සියලුම කටයුතු වලට තොරතුරු අත්‍යවශ්‍යමයි.



## පොදු අධිකාරීන් යනු මොනවාද?

පොදු අධිකාරීන් කිහිපයක් පහත දැක්වේ.

- අමාත්‍යාංශ
- රාජ්‍ය දෙපාර්තමේන්තු
- පළාත් පාලන ආයතන
- පොලීසිය
- අධිකරණ
- රජය මගින් පිළිගත් හෝ යම්තාක් දුරට රජයේ අරමුදල් ලබන පෞද්ගලික අධ්‍යාපන ආයතන
- රජයේ අරමුදල් ලබන උසස් අධ්‍යාපන ආයතන

# තොරතුරු දැනගැනීමේ අයිතිය ඔබට වැදගත් වන්නේ ඇයි?

ඔබගේ අයිතිවාසිකම් රැක ගැනීමට තොරතුරු අවශ්‍ය වන නිසා තොරතුරු දැන ගැනීමේ අයිතිය ඉතා වැදගත්.



## ඔබට ලබාගත හැකි තොරතුරු කිහිපයක්

ඇතැම් උදවිය පමණක් ප්‍රතිලාභ ලබන්නේ ඇයි?



රැකියා ලබාදීමේදී අනුගමනය කරන මිනුම් මොනවාද?



සම්මුඛ පරීක්ෂණයකදී ලැබුනු ලකුණු ප්‍රමාණය කීයද?



ඔබේ දරුවා පාසලට තෝරා නොගත්තේ ඇයි?



වැනි එදිනෙදා ජීවිතයට අවශ්‍ය තොරතුරු ඇතුලුව නොයෙක් තොරතුරු ලබාගන්න පුළුවන්.

## තොරතුරු දැනගැනීමේ අයිතිය නිසා ඔබට ලැබෙන ප්‍රතිලාභ

- එදිනෙදා ජන ජීවිතයේදී ඇති වන ගැටළු විසඳා ගැනීමට
- රටේ දූෂණය තුරන් කිරීමට හෝ අවම කිරීමට
- නිදහස් හා සාධාරණ මාධ්‍යයක පැවැත්මට
- ආණ්ඩුවේ වියදම් සීමා කිරීමට
- ආණ්ඩුවේ ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති ප්‍රශ්න කිරීමට
- සාධාරණ මැතිවරණ පැවැත්වීමට
- අයිතිවාසිකම් සම්බන්ධව දැනුම ලබා ගැනීමට හා ආරක්ෂා කර ගැනීමට

- ආර්ථික වර්ධනයට
- මහජන සේවය කාර්යක්ෂමව ලබා ගැනීමට

**තොරතුරු දැනගැනීමේ අයිතිය ලෝකයේ බොහෝ රටවල ක්‍රියාත්මක වෙනවා.**

උදා : ඕස්ට්‍රේලියාව, චීනය, දකුණු අප්‍රිකාව, තායිලන්තය, උගන්ඩාව, ජර්මනිය, ඉන්දියාව

ලංකාවේ අසල්වැසි ඉන්දියානුවන් මෙම අයිතියෙන් උපරිම ප්‍රයෝජන ගන්නවා. මෙන්න පුංචි උදාහරණ දෙකක්.

කුලීකරුවෙකු වූ නන්නු නැමැත්තෙක් තමාට ආණ්ඩුවෙන් ලැබුණු සලාක කාඩ්පත නැතිවුනු නිසා ඩුප්ලිකේට් කාඩ්පතක් ලබා ගන්න අයදුම් කරා. රෙගුලාසි අනුව දින 10 ක් ඇතුලත නව කාඩ්පත ලැබිය යුතුය. නමුත් මාස 3 ක් ගත වුවත් සලාක කාඩ්පතක් ගන්න බැරි වුනා.

නන්නු මේ නිසා තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ තොරතුරු ලබා ගැනීමට අයදුම් කළා. ඔහු තම සලාක කාඩ්පත ලබා ගැනීමට කළ ඉල්ලීම පිළිබඳ දෛනික ප්‍රගති වාර්තාවක්, සලාක කාඩ්පත ලබාදීමට පියවර නොගත් නිලධාරීන්, නිලධාරීන් විසින් නීති කඩ කිරීමට එරෙහිව අධිකාරිය ගන්න පියවර, පියවර ගන්න දිනය සහ සලාක කාඩ්පත

ලැබෙන දිනය යන තොරතුරු ඉල්ලුවා. තොරතුරු ඉල්ලා දවස් හතරකින් සලාක කාඩ්පත ලැස්තියි කියා නන්නුට අධිකාරියෙන් දැනුම් දුන්නා.



නන්නු අහපු ප්‍රශ්නවලට තොරතුරු ලැබුනා නම් අධිකාරියේ එම නිලධාරීන්ට නීතිය ඉදිරියේ දඬුවම් ලැබීමට හැකියාවක් තිබුණා. ඒ බියටම නන්නු තම තොරතුරු දැනගැනීමේ අයිතිය පාවිච්චි කළ විටම ඔහුගේ සලාක කාඩ්පත ලබාදීමට නිලධාරියා ඉක්මනින් පියවර ගත්තා. නිලධාරියා නන්නු ට තම තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ඉල්ලා අස්කරගන්නා ලෙසට ඉල්ලීමක් ද කළා.

කවීනා නැමැති පුංචි දැරිවියක් තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ තමාගේ ගමට බස් රථ සේවාවක් නැති වීමට හේතු පොදු අධිකාරියෙන් ඉල්ලුවා. පොදු අධිකාරිය පිළිතුරු දෙමින් පැවසූවේ බස් රථ සේවාවක් ක්‍රියා කිරීම පාඩු වන බවයි. නමුත් මෙය ඉතාමත් ලාභදායී බව සනාථ වුනා. ඒ නිසා ගමට බස් රථ සේවාවක් ලබා ගැනීමට කවීනාට හැකි වුනා.



TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා


කොළඹ : 0114369781 | 0114369782 | 0114369783

මාතර : 041 22 33 522

වවුනියා : 0242227676


## සර්වෝදය ශ්‍රමදාන සංගමය


අනුරාධපුර : 0252222738

කොළඹ : 0114365126

මාතර : 0412222145

ත්‍රිකුණාමලය : 0262220083

රත්නපුර : 0452231174